# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2165/52 - 2020 මාර්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2020.03.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, එකී මණ්ඩලයට ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතියේ පල්ලේගම, තවලන්තැන්න ජල ගබඩා ටැංකිය, ජල පොම්පාගාරය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
''ලක්දිය මැදුර'',
අංක 35හි පිහිටි
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1534

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 55 ඒ, පල්ලේගම ග්‍රාම නිලධාරි වසමේ පල්ලේගම ගමේ පිහිටි මේ සමග එවන දළ සැලැස්මේ දැක්වෙන කොඩමඩිත්ත පතන ඉඩම නැමැති සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.075 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

03 - 829


1A - G 32168 — 28 (2020/03)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*